> **"විනාස කාලේ විපරීත බුද්ධි... රජවාසලට හාමුදුරු කෙනෙක් ගොඩ වුණත් උන්වහන්සෙට උස් ආසනේ පනවලා රජ්ජුරුවො පහත් ආසනේ වාඩි වෙනවා.. එහෙව් ගරු කටයුතු සාසනයක් මේක.. ගිහි සමාජයට ඉහළින් ඉඳන් අවවාද අනුශාසනා කරන්න ඕනෙ පූජනීය ඇත්තො ගිහියන්ටත් වඩා පහළට වැටෙනවා දකින්න අපි පව් කළානෙ ඇත්තට.."**

# ඇඩ්ස්

## ජගත් ජේ එදිරිසිංහ ලියයි



# 2

අයේෂා ගල්වාගෙන සිටින විළවුන් සුවඳ සුනන්ද ගේ නැහැපුඩු දවාගෙන යයි. ඔහු ඈ දෙස බලන්නේ සඟවාගත් අප්‍රසාදයෙන් යුතුව ය.

"වැඩ ඉවර නං ගෙදර යන්ඩ මිසී.. " ඔහු ගේ කට හඬෙහි ගැබ් වන්නේ ඒ අප්‍රසාදයයි. අයේෂා ගේ දෑසින් නිකුත් වන නොපහන් බැල්ම සුනන්ද ගේ සිතේ ඇති කරන්නේ සතුටකි.

"ඔයා නං කිසිම වැඩකට නැති පිරිමියෙක්.." ඈ කියන්නේ අත් බෑගය අතට ගන්නා අතර ය. සිය සිතේ හටගත් නොරිස්සුම ඒ වදන් වල හොඳින් ගැබ් වන්නට ඇතැයි ඇයට සිතෙයි.

"වැඩකට ඇති පිරිමි කොයි වගේ ද..? බැරිද කියලා දෙන්න..?" මුහුණට මුහුණ ලා සිට ගත් විට ඇගේ ඇස් හොඳින් පෙනෙයි. ඒ ඇස් තුළ පිරිමියකු වසඟ කර ගත හැකි ආකර්ශණයක් ඇතැයි සුනන්දට සිතෙයි. තමා ඒ ආකර්ශණයට හසු නොවන්නේ මන්දැයි ඔහුට නොවැටහෙයි. ".. අනේ මේ අයේෂා.. මගෙන් මුකුත් අහගන්නෙ නැතිට දැන් ගෙදර යන්ඩ.."

"ඔයා ආදරේ කරන්ඩවත් දන්නෙ නැති ගල් බමුණෙක්.."

"ආයෙ කියනවා බලන්ඩ.."

"ගල් බමුණෙක්..."

සුනන්දට සිනා යන්නේ ඇය එය කියන තාලයට ය.

"මේ අහපං නංගියේ... මං දුප්පත් මිනිහෙක් තමයි.. ඒත් මට ප්‍රතිපත්තියක් තියෙනවා.. සිංහලෙන්ම කියන්ඩ ද..? මං බුදියන්නෙ මං ආදරේ කරන ගෑනියෙක් එක්ක විතරයි.. තේරුණා ද..?" අයේෂා මුහුණ රතු කර ගනු කන්තෝරු කාමරයෙන් පිටවන අතරේ සුනන්දට පෙනෙයි.

මන්ත්‍රී නිවසේ මහ දොරටුව ඉදිරියේ පෝටිකෝව යට නවතා ඇති අලුත්ම ප්‍රාඩෝ ව සැඳෑ හිරු එළිය වැදී දිළිසෙයි. ගරාජය කෙළවරේ පුටු දෙකක වාඩි වී සිටි ගුණේත් අමරේත් සුනන්ද දැක නැගී සිටියි. රණසිංහ මහත්තයා ගේ ආරක්ෂක බල ඇණියේ රස්සාව ඔවුන්ට ලැබුණේ සුනන්ද නිසා ය. කර පියවූ සුදු කමිසයත් කලු දිග කලිසමත් කොටට කැපූ කොණ්ඩයත් උන් දෙදෙනා හඳුනාග න්නට නොහැකි කරවන තරමට වෙනස් කර ඇතැයි සුනන්දට සිතෙයි.

සුනන්ද පෝටිකෝවේ සිට පඩි තුන නැග මහ දොර ඉදිරියේ සිට ගනියි. මේ මහා බංගලාව ඉදි කරන්නට පෙර මෙතැන තිබූ උලු ගෙදර සුනන්දට තවම මතක ය. ඒ උලු ගෙදරට ගොඩ වන්නටත් මෙවැනිම පඩි තුනක් තිබුණි. රතු සිමෙන්ති දැමූ ඒ පඩි පෙළ මත වාඩි වී රණසිංහත් තමාත් අනාගත සැළසුම් සකස් කළ හැටි කෙසේ අමතක කරන්න ද...?

නගර සභා චන්දයේ දී බෝම්බ පහරින් සිහිසුන් වුණ රණසිංහ දෑතින් ඔසවාගෙන තමා ඒ පඩි පෙළ නැග්ග හැටි මේ පඩි නගින සෑම දිනකම සුනන්දට සිහිපත් වෙයි. තමා හැමදාමත් කළේ මහත්තුරුන්ව ඉහළට නග්ගන එකම නොවේදැයි ඔහුට සෑම විටම සිතෙයි.

"මහත්තය පඩි තුනක් උඩින් තියලා මං ආපහු මිදුලටම බැස්සා.. මං මිදුලෙ වැලි පොළොවෙ එහෙමම බලාගෙන ඉන්දැද්දි මහත්තයා තවත් පඩි දහයක් උඩට ගියා.." බොහෝ කලකට පසු හමුවූ දිනෙක සුනන්ද රණසිංහට කීවේ ය. ඒ හිතේ අමාරුව වැඩි වූ දවසක ය.

"මං එහෙම නොකළා නම් ඒ ගමන යන්න බැරි වෙනවා මල්ලි.. මං හිත හදාගෙන එහෙම කළ හන්දා තමයි අද උඹට වුණත් මං ළඟට ඇවිත් වැඩක් කරවගන්න පුලුවන් තැනකට මං ආවෙ.."

"ඒත් ඒ කාලෙ මං හිතා හිටියෙ මහත්තයා මං ළඟට ඇවිත් මට වැඩක් කරලා දෙයි කියලා. "

රණසිංහ සිනා සෙන්නේ කොක් හඬලමිනි. ඒ සිනාව සුනන්දට අප්‍රසන්න ය. එය ව්‍යාජ සිනාවක් යයි ඔහුට සිතෙයි. ඉස්සර එවැනි ව්‍යාජ සිනාවක් රණසිංහ ළඟ තිබුණේ නැත.

"මේ ලංකාවෙ කොහෙද මල්ලි එහෙම එකක් වෙන්නෙ..? බලය තියෙන තැනට මිනිස්සු එනවා මිසක් ... "

"අපට හැමදාම වැරදුණේ එතන තමයි මහත්තයා... අපි හැමදාම හිටියෙ හීනෙක.. හැබෑ වෙයි කියලා අපි හිතා හිටියට කවදාවත් හැබෑ නොවන හීනෙක"

"මේ ටික කාලෙට උඹ පිස්සෙක් වෙලා වගේ.."

රණසිංහ තවමත් සිනාසෙයි.

"ඒක හරි.. කාලෙකට ඉස්සර අපි රණසිංහ අයියගේ කාර් එකට තල්ලු ස්ටාට් එකක් දුන්නා.. අයියා අපි පාරෙ ඉන්දැද්දි ඉස්සරහටම ගිහින් මන්ත්‍රී කෙනෙක් වුණා.. කාර් එක පස්සෙ දුවන්න අපේ කකුල් හයිය නැහැනෙ මහත්තයා.."

"ආනේ.. සුනන්දනේ.. එන්න ඇතුළට.. මොකද මේ දොර ළඟ හිටගෙන කල්පනා කරන්නෙ..?" සුනන්ද හිස ඔසවා වින්ධ්‍යා දෙස බැලුවේ ය. ඇගේ නිහතමානී සිනාව වෙනදා සේ ම ය. ".. බොහොම දුර ඈතක නේද හිතින් හිටියෙ.. මං බලාගෙන හිටියෙ.."

"මට ඉස්සර සිද්දියක් මතක් වුණා මැඩම්.. අපි දන්නෙම නැතුව හුඟක් කාලයක් ගිහින්.." සුනන්ද වාඩි වෙයි.

"එයා බාත් රූම් එකේ.. මං ගිහින් කියන්නං.. ඉන්න මං බොන්න මොනා හරි එවන්නං" වින්ධ්‍යා ගෙතුළට ගිය සැණින් ආපසු එයි. ".. අනේ සුනන්ද අර මං කිව්ව වැඩේ ඔයා බැලුවෙ නැහැනෙ.."

".."

"අර අපේ මහ ගෙදරට ගෑනු කෙනෙක් හොයලා දෙන්නයි කිව්ව එක.."

"හෙව්වා මැඩම්.."

"බොරු නේද..?"

"ඇත්තමයි මැඩම්.. හෙව්වා.. වත්තෙ දැන් ගෑනුත් නෑ.. හතරෙන් තුනක් රට ගිහින්.. ඉතුරු වෙලා ඉන්නෙ ලෝකෙ කාලා වතුර බීපු එවුන්.. එහෙම අය මැඩම්ලගෙ ගෙදරට යවන්න බැහැ.. අපි තව ටිකක් බලමු.. මං තව හොයන්නං.."

සුනන්ද සේවිකාවක ගෙන ආ දොඩම් යුෂ වීදුරුව අතට ගනියි.

ඈත කෙළවර බිත්තියට සවි කළ සේසත් දෙක සාලයට වැදගත් බවක් එක් කරයි. එයට පහළින් ඇති කලුවර කව්ච්චිය මිල අධික එකකි. සාලයේ ටීපෝව මත ඉංග්‍රීසි සඟරා කීපයකි. ඒවා වින්ධ්‍යා කියවන ඒවා විය යුතු ය. නුවර මහා විද්‍යාලයක අධ්‍යාපනය ලද ඈ රණසිංහ හා විවාහ වූයේ පෙර දැන ඇඳුනුම් කමකට නොවේ - උසස් පෙළපතක් හා පෑහෙන්නට රණසිංහට තිබූ උවමනාවත් ඉහළට යන දේශපානඥයකු සිය බෑනා කරගන්නට වින්ධ්‍යාගේ පියාට තිබූ උවමනාවත් යන දෙකම මනාව පෑහුණ නිසාවෙනි.

"අපි යමු ද මල්ලි..?" ගෙතුළ සිට සාලයට එන රණසිංහ ගල්වා ඇති සුවඳ විලවුන් සුවඳ දසත විසිරෙයි. ".. අපි එන්න ටිකක් රෑ වෙයි.. ඔයා බලා ඉන්න එපා.. නිදාගන්න.." වින්ධ්‍යා හැඟීම් විරහිත බැල්මක් රණසිංහ වෙත හෙළනු සුනන්ද දකියි. ඒ බැල්ම තේරුම් ගත නොහැකි ය. සඟවාගත් අප්‍රසාදයක් එහි ඇතැයි සුනන්දට සිතෙයි.

"යන්නම් මැඩම්.." සුනන්ද රණසිංහ පසුපසින් දොර වෙත යයි. වින්ධ්‍යා ගේ සුහද සිනාව සිතට සහනයකි.

"පිකප් එක ගන්න.." රණසිංහ යතුර සුනන්ද

> **සුනන්ද පෝටිකෝවේ සිට පඩි තුන නැග මහ දොර ඉදිරියේ සිට ගනියි. මේ මහා බංගලාව ඉදි කරන්නට පෙර මෙතැන තිබූ උලු ගෙදර සුනන්දට තවම මතක ය. ඒ උලු ගෙදරට ගොඩ වන්නටත් මෙවැනිම පඩි තුනක් තිබුණි. රතු සිමෙන්ති දැමූ ඒ පඩි පෙළ මත වාඩි වී රණසිංහත් තමාත් අනාගත සැළසුම් සකස් කළ හැටි කෙසේ අමතක කරන්න ද...?**

අතට දෙයි.

"සෙකියුරිටි..?"

"එපා.. අපි දෙන්න විතරයි යන්නෙ.."

"සෙකියුරිටි නැතුව යන එක හොඳ නෑ නේද..?"

රණසිංහ වාහනයට ගොඩ වන්නේ සුනන්දට පිළිතුරක් දෙන්නට උත්සාහ නොකරමින් ය. රියැදුරු අසුනේ වාඩි වන සුනන්ද වාහනය හරවා මහ පාරට දමයි. යන්නේ කොතැනටදැයි නොඅසා ම ඔහු වාහනය පදවයි.

"මං හෙම්බත් වෙලා ඉන්නෙ මල්ලි..." රණසිංහ සුනන්දගේ කමිස සාක්කුවේ වූ පැකට්ටුවෙන් දුම්වැටියක් ගෙන දල්වාගනියි. ".. මං මේ සිගරට් එකක් බොන්නෙ මාස ගානකට පස්සෙ.. ඒකටවත් නිදහසක් නැහැ"

"මොකද්ද ප්‍රශ්නෙ..?"

"මට මහන්සියි. විවේකයක් ඕනෙ.. මිනිස්සුන්ගෙ ඇස් වලින් ගැලවිලා එක පැයක් හරි නිදහසේ ඉන්න ඕනෙ.. මේ යාන්ත්‍රික ජීවිතේ මට දැන් ඇති වෙලා.. උඹට තේරුම් ගන්න පුලුවන් ද මන්දා.." රණසිංහ අසුනේ පසුපසට බර වී දෑස් පියා ගනියි. "...මතකද අපි ඉස්සර හැන්දෑවට ඇල කණ්ඩිය අයිනෙ බංකුවට වෙලා සිගරට් බිබී කතා කර කර හිටිය හැටි.."

සුනන්ද හැරී රණසිංහ දෙස බලයි. ඔහු තවමත් දෑස් පියාගත්වන ම ය.

"මොකද අමතක.. මං හිතං හිටියෙ මහත්තයට ඒවා අමතක වෙලා කියලයි.. මට ඒ හැම දෙයක්ම මතකයි මහත්තයා.. ඒ කාලෙ මං නෙවෙයි හීන මැව්වෙ... මහත්තයයි.."

"ඒ කාලෙ සුන්දරයි සුනන්ද.. ජීවිතේ සරළයි.. සැහැල්ලුයි.."

"මහත්තයා දුවපු වේගෙ වැඩියි කියලා හිතෙන්නැද්ද..?"

"එහෙම නොදුවා මේ රේස් එක දිනන්න බැහැ බං.. මං දින්නෙ එහෙම හැල්මෙ දුවපු නිසයි.."

"දැන් ඉතින් දිනලද මේ ඉන්නෙ..?"

"දිනල ද...?" රණසිංහ මොහොතකට දෑස් වසා ගනියි. දිනල ද...? ඔහු තොල් මතුරයි. ඒ ප්‍රශ්නයට පැහැදිලි පිලිතුරක් ඔහු නොදනියි. "අපි කොහේ හරි නිදහසේ කතා කර කර ඉන්න පුලුවන් තැනකට යමු.."

"බීච් රෙස්ටොරන්ට් එකට..?"

"පිස්සුද බං.. මාව අඳුනන්නෙ නැති කෙනෙක් ඉන්නව ද..?" රණසිංහ කල්පනාවට වැටෙයි "උඹට මතකද අපි ඉස්සර සමදරා නැන්දලගෙ ගෙදර යනවා.. ගේ ඉස්සරහ පොඩි සමර් හට් එකක් තිබුණා.. ඒක යටට වෙලා අපි මහ රෑ වෙනකල් බීර බොනවා.. අයෝමා.. උඹේ කෙල්ල .. ඒකි අපට කන්න හදලා දෙනවා.. ඒ සමර් හට් එක තාම තියෙනවද සුනා..?"

සුනන්ද පිළිතුරක් දෙන්නට උත්සාහ නොකරයි. මහපාරට රවා ගත් වන ම වාහනය පදවන ඔහුට අයෝමා සිහිවෙයි.

"රණසිංහ කියන්නෙ අවස්ථාවාදියෙක්.. ආත්මාර්ථකාමියෙක්.. තේරෙන්නැද්ද ඒක ඔයාට.." අයෝමා මන්තරයක් සේ මුමුණන රණසිංහ පිලිබඳ නිර්වචනය සැබෑදැයි සුනන්ද යළි යළිත් කල්පනා කරයි.

"අපි එහේ යං සුනා..." රණසිංහ මහත් ප්‍රබෝධයකින් කියයි.

00000

පොතට මුහුණ යොමාගෙන සිටි අයෝමාගෙ දෑහැණ බිඳ වැටෙන්නේ මිදුලේ නවත්වන ලද වාහනයේ හඬින් ය. වාහනයේ දොරු ඇරෙන හඬත් වැසෙන හඬත් ඈ කාමරයේ සිට ම අසා සිටියි.

"සමදරා නැන්දේ.. ගෙදර ඉන්නවදෝ..." රණසිංහගේ කටහඬ ඇයට හොඳින් පුරුදු ය.

"රණසිංහකාරයා..." අජිත් කාමරයට හිස පොවා රහසින් කියයි.

"අයිය ගිහින් කතා කරන්න.. මං එන්නං.." අයෝමා අවුල්ව ගිය හිසකෙස් සකස් කරගන්නා අතර කියයි.

රණසිංහ සාලයේ සැප පුටුවේ වාඩිවන්නේ අනාරාධිතව ය. එක් කළෙක මේ ගෙය තමාගේ ගෙදර මෙන් හුරු පුරුදුව තිබුණා නොවේදැයි ඔහුට කල්පනා වෙයි. මේ කිසිවක් වෙනස් වී නැතුවා වාගේ ය. සාලයේ කෙළවර සිටවා තිබූ පිත්තල පහන පවා තවමත් එතැනම ය. එදා සේම අදත් එය දීප්තිමත්ව බැබලෙයි.

සුනන්ද මගදී මිලට ගත් මස් පාර්සලය අතැතිව මුලුතැන් ගෙයට යයි. සමදරා නැන්දා යමක් උයමින් සිටියි. ඔහු පාර්සලය ඈ ඉදිරියේ මේසය මත තබයි.

"නැන්දෙ..."

"පුතේ.. ඇහුණෙම නැහැ එනවා.." ඈ සිනාසෙයි.

24 වන පිටුවට